**මූදූර් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලදිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 06 ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මූදූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| අත්තිකාරම් ශේෂ | 11,139,745 | අත්තිකාරම් ලේඛනය | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ගිණුම් ශේෂ තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | 2006 වර්ෂයට පෙර පැවති අත්තිකාරම් සම්බන්ධයෙන් තොරතුරු 2006 වර්ෂයේ මූදූර්වල ඇති වූ කලකෝලහල හේතුවෙන් අයකර ගත නොහැකි වී තිබුණි. එමෙන්ම ඉදිරි අනාගතයේදී අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් සියළුම කාරණා සම්පූර්ණ කොට ඔබගේ විගණන කටයුතුවලට ඉදිරිපත් කරනු ලැබේ. |

**1.4** අනුකූල නොවීම

---------------------

**නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීතී, රීතී. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 සිට 04 දක්වා කල් ඉකුත් වූ රු.37,300 ක තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්ෂ 03 සිට 04 ක් දක්වා වූ කල් ඉකුත් වූ (2015-2016) රු.37,300 ක් සභාවේ තීරණය පරිදි ආදායමට මාරුකිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන | | | |
| | (i) 191 වගන්තිය | මාසිකව සහා කමිටු වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාසිකව සහා කමිටු වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කල යුතු වේ. | පසුගිය 2019.01.17 දින සිට මාසිකව පැවති සභා රැස්වීම් තීරණවලට අනුකූලව සහතික කළ පිටපතක් යවා ඇත. ඉදිරි අනාගතයේදී අලුත්වැඩියා කරනු ලැබේ. |
| | (ii) 193 වගන්තිය | වර්ෂයට අදාළ තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | පසුගිය 2018 වර්ෂය සඳහා මෙම විචලනයන්ට අදාළ විස්තර වාර්තා සකස් කර සිදු වූ විචලනයන් හඳුනාගෙන තිබුණි. ඒවා ඉදිරි කාලවලදී නිවැරදි කරනු ලැබේ. |
| (ඇ) | මෝටර් රථ ප්‍රවාහන පනත 203 වගන්තිය | සෑම වර්ෂයක් පාසාම සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. එනමුත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 09 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ආදායම් | සෑම වර්ෂයක් පාසාම සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. | අදාළ වාහන සඳහා ලිපි ලේඛන පරිත්‍යාග කරනු ලැබූ ආයතනවලින් ලබාගැනීමට නොහැකි නිසා මෙම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. අපගේ අංක |

| | |
|---|---|
| බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | MUPS/WP/RMP/2017 දරන 2017.10.25 දිනැති ලිපිය මඟින් මෙම වාහන සඳහා ලිපිලේඛන ඉල්ලීම් කර තිබුණද ඒවාද ලැබී නොතිබුණි. පසුගිය 2018 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියෙන් පරිත්‍යාග කරනු ලැබූ වාහන 03 සඳහා අයිතිය පැවරීමේ ආකෘති පත්‍ර අත්සන් කර නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණි. අඛණ්ඩව මෙහි කටයුතු සිදු කෙරෙමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,170,412 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 103,812 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කල ආදායම් | 2018 අයකළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කල ආදායම් | 2017 අයකළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් බදු | 850 | 850 | 422 | 428 | 806 | 816 | 460 | 346 |
| (ii) | කඩ කුලී | 17,295 | 14,512 | 14,014 | 3,281 | 11,960 | 9,477 | 11,057 | 902 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,398 | 1,369 | 1,180 | 218 | 1,075 | 1,398 | 1,043 | 32 |

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු පසුගිය වර්ෂයට වඩා රු.82,000 කින් වැඩි වී තිබුණි. මෙය වරිපනම් බදු අයකිරීමේ මන්දගාමී ස්වරූපය පෙන්නුම් කරයි. තවද, කඩ කුලී සහ බලපත්‍ර ගාස්තු පිළිවෙලින් රු.2,379,000 ක් සහ රු.186,000 කින් ඉහළ ගොස් තිබීම එම ආදායම්වල අයකිරීම් මන්දගාමී ආකාරයෙන් සිදු වන බව හෙළිදරව් කරයි.

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ පවතින ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලි ආදිය මත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, අයකර ගත යුතු එකතුව රු.6,213.099 ක් වූ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු හිඟ ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා රු.82,000 කින් වැඩි වී තිබීමට පහත සඳහන් කාරණා හේතු වේ. වරිපනම් බදු අයකිරීම පසුගිය වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ අඩු වී තිබුණි. අපගේ බල ප්‍රදේශයට අයත් බහුතරයක් ඉඩම් පුද්ගලයන් අතර නොපැවරීම නිසාත්, නම මාරු නොකිරීම නිසාත්. ඉඩම් හිමිකරුවන් හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. වරිපනම් බදු අයකිරීමේදී විශාල අසීරුතාවයන්ට මුහුණ දීමට සිදු වී තිබේ. දැනට හිඟ වරිපනම් බදු අයකිරීමට විශේෂ වැඩසටහන් සකස් කර මෙම හිඟ මුදල් අයකිරීමට සියළුම ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක කෙරෙමින් පවතී. |

### 2.2.3 කඩකුලී ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බස් නැවතුම්පොළ කඩ කාමර කුලී ආදායම්<br>පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.22,820,738 ක පිරිවැයට 2013 වර්ෂයේ ඉදිකළ කඩ කාමර 40 කින් සමන්විත කඩ පේළිය 2014 වර්ෂයේදී බදු දී තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව, ගිවිසුම් ගත වූ කඩ කාමර බදු දිය යුතු අතර ඉහත සඳහන් කඩ කාමර 40 න් කඩ කාමර 33 ක් පමණක් ගිවිසුම් ගත වී බදු කාලය සඳහන් නොකර දීර්ඝකාලීන බද්දට ලබා දී තිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව ගිවිසුම් අත්සන් නොකළ කඩ කාමර සඳහා වහාම ගිවිසුම් අත්සන් කළ යුතු වේ. එසේම, ගිවිසුම් අත්සන් කිරීමේදි බදු කාලය සඳහන් කළ යුතු වේ. | අදාළ කාලපරිච්ඡේදය තුළ ආරක්ෂිත ඇප ගෙවීමට අපොහොසත් වූ කඩ කාමර 07 කට ගිවිසුම් අත්සන් කර නොතිබුණි. වර්තමානය දක්වා කඩ කාමර 33 ක් සඳහා ආරක්ෂිත ඇප මුදල් ලබාගෙන ඇති අතර මේ දක්වා වූ හිඟ මුදල් අයකර ඔවුන් වෙනුවෙන් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර ඇත. එසේම, මෙම වර්ෂයේදී (2018) මෙම කඩ කාමර සඳහා වූ පසුගිය හිඟ මුදල් කොටස් වශයෙන් අයකර ගනිමින් පවතී. හිඟ කුලී කොටස් වශයෙන් අයකර ගනිමින් පවතින අතර ගෙවීම් නොකළ අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) | ලබා දී කඩ කාමර සම්බන්ධයෙන් 2014 ජනවාරි 01 දින සිට විගණන දිනය වන 2018 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගත යුතු රු.1,247,630 ක හිඟ කඩ කුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. තවද, ඉදිරි කාලයේදී කඩ කුලී හිඟ ඇති නොවන ආකාරයට කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කුලී කොටස් වශයෙන් අයකර ගනිමින් පවතින අතර ගෙවීම් නොකළ අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | ගිවිසුමෙහි 6 වගන්තිය අනුව, ගෙවිය යුතු කුලී මුදල් ගෙවීම් පැහැර හරින ගිවිසුම්කරුවන්ට ඔවුන් වෙනුවෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට සභාවට අයිතිය තිබුණත් කිසිඳු ක්‍රියාමාර්ගයක් මේ දක්වා සභාව විසින් ගෙන නොතිබුණි. | කුලී ගෙවීම් පැහැර හරිනු ලබන අය සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | |
| (iv) | ගිවිසුම් 2 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ සිට වර්ෂයක් පාසාම කුලී වටිනාකමින් 10% ක් වැඩි කළ යුතු බව සඳහන් වුවද, මේ දක්වා මෙම වැඩිකිරීම සිදුකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව 10% ක් වැඩිකිරීම එසේ වැඩිකර කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම 2 වගන්තිය ප්‍රකාරව වර්ෂයක් පාසාම කුලී වටිනාකමින් 10% ක් වැඩිකිරීම සිදුකර අයකිරීම් කොටස් වශයෙන් සිදුකිරීමට කටයුතු යොදා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාවලවඩි හන්දියේ කඩ කාමර පේළිය කුලියට ලබාදීම<br>------------------------------------<br>නාවලවඩි හන්දියේ කඩ කාමර පේළිය කුලියට ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව, සභාව විසින් 2016 වර්ෂයේදී කුලියට ලබාදුන් කඩ කාමර 06 ක් සඳහා මේ සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා, අදාළ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව ගිවිසුම් අත්සන් නොකළ කඩ කාමර සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර සඳහා ගිවිසුම් ගතවීමට වහාම ක්‍රියාකරන අතර, හිඟ කුලී ද අයකිරීමට කටයුතු යොදා ඇත. |
| (ii) | මෙම කඩ කාමර සඳහා හිඟ කුලී සමාලෝචිත වර්ෂය දක්වා රු.185,400 ක් වුවද, මෙම හිඟ කුලී විගණන දිනය වන 2019 මාර්තු 21 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. තවද, ඉදිරි කාලයේදී හිඟ කුලී ඇති නොවන ආකාරයට කුලී අයකිරීමට සිදු කළ යුතු වේ. | මෙම කඩ කාමර සඳහා ගිවිසුම් වලට වහාම එළඹිය යුතු අතර හිඟ කුලී ද අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කාර්යාල කඩ කාමර හිඟ කුලී<br>--------------------------------<br>කාර්යාල කඩ කාමරවලින් කඩ කාමර 14 ක් සඳහා හිඟ කුලී රු.914,894 ක් වුවද, මෙම හිඟ මුදල් විගණන දිනය වන 2019 මාර්තු 21 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමේ කටයුතු සිදු කළ යුතුය. තවද, ඉදිරි කාලයේදී හිඟ කුලී ඇති නොවන අයුරින් කුලී අයකළ යුතු වේ. | කාර්යාල කඩ කාමර පේළි සඳහා මාස 20 ක කාලපරිච්ඡේදයක ආරක්ෂිත ඇප ගෙවීම් කර ඇත. මෙම වටිනාකම වැඩි නොවන අයුරින් මාසික හිඟ කුලී අයකිරීමට කටයුතු සිදු කර ඇත. |
| (ඈ) | වෙළඳපොල කඩ කාමර ආදායම්<br>-----------------------------------<br>සභාව සතු වෙළඳපොල කඩ කාමර 82 ක් කුලියට ලබාදීම සම්බන්ධයෙන් විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව සභාව විසින් වර්ෂ 20 කට පෙර කුලියට ලබාදුන් කඩ කාමර 82 ක් සඳහා මේ දක්වා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ගිවිසුම් සඳහා එළඹ නොමැති කඩ කාමර සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. ඔබ විසින් සඳහන් කළ ආකාරයට ගිවිසුම්වලට එළඹීමෙන් පසු එහි පිටපත් ඉදිරිපත් කළ යුතු වේ. | එළඹ තිබූ ගිවිසුම් අළුත් නොකිරීම නිසා එය අලුත් කිරීමට අවශ්‍ය කටයුතු ඉක්මනින් සිදු කෙරේ. |
| (ii) | මෙම කඩ කාමර හිඟ කුලී සමාලෝචිත වර්ෂය දක්වා රු.1,591,692 ක් වුවද, මෙම හිඟ කුලී මුදල් විගණන දිනය වන 2019 මාර්තු 21 දින වන විටත් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුය. තවද, ඉදිරි කාලයේදී හිඟ කුලී ඇති නොවන අයුරින් කුලී අයකිරීම සිදුකළ යුතු වේ. | 2019.04.30 දින වන විට රු.86,290 ක් අයකර ගෙන තිබුණි. මෙම මුදල සැසඳීම් කිරීමේදී අඩු අගයක් ලෙස පෙනුණත්, ඉතා ඉක්මනින් අදාළ කාල සීමාවන් ලබාදෙමින් සියළුම මුදල් අයකිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, කාලසීමාව තුළ හිඟ මුදල් ගෙවීම් නොකර කඩවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (iii) | මෙම ප්‍රදේශයේ වර්තමානයේ පවතින කුලී වටිනාකම අවම වශයෙන් රු.3,000 සිට රු.5,000 ක් වුවද, සභාව විසින් වර්ෂ 20 කට පෙර තීරණය කළ රු.150 සිට රු.500 දක්වා පරාසයකින් මේ දක්වා කුලී වටිනාකම තීරණය කර තිබුණි. | කුලී වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වේ. | අපගේ කාර්යාල ආදායම් සුපරීක්ෂකවරුන් ලවා කඩවල වර්ගඵලයට අනුව තාවකාලික කුලියක් තීරණය කර කුලී අයකිරීමට කටයුතු කර ඇත. |
| (iv) | මෙම කඩ කාමරවලින් කඩ කාමර 30 ක් නියැදි පරීක්ෂාවක් අනුව පරීක්ෂා කිරීමේදී කඩ කාමර ලබාගත් කඩ කුලී හිමියන් 15 දෙනෙකු එම කඩ කාමර මාසික කුලිය රු.700 සිට රු.4,500 ක් වන වටිනාකමට උප බදු දී තිබුණි. | උප බදු ලබාදුන් අයට එරෙහිව විධිමත් අයුරින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සියළුම කඩ කාමර පරීක්ෂා කොට මේ සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ඉ) | මස් කඩ බදු ආදායම්<br>----------------------- | | |
| | මස් කඩ බදුකරුවන් බදු ගෙවීම පැහැර හැරීමේදී ඔවුන්ගේ ආරක්ෂිත ඇප තැන්පතුවලින් බදු වටිනාකම අය නොකර වර්ෂය අවසානයේ මෙම ක්‍රියාවලිය | අයකළ යුතු හිඟ මුදල් සියල්ල අයකර ගත යුතු අතර අනෙකුත් ඒවා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පසුගිය 2017 වර්ෂ ආරම්භයේදී රු.10,142,162 ක් මස් කඩ හිඟ ආදායම් වශයෙන් පැවතුණද, 2017 වර්ෂයේ පසුගිය වර්ෂවලට අදාල හිඟහිටිවලින් |

| | | |
|---|---|---|
| අනුගමනය කරන බැවින් රු.8,297,399 ක් වූ හිඟ, අයකර නොමැතිව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවතුණි. තවද, මෙම හිඟ මුදල් සඳහා සභාව විසින් කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | රු.1,839,008 ක් පමණ අයකරගෙන තිබුණි. 2017 වර්ෂ අවසානයේදී රු.8,303,154 ක් දක්වා අඩු කර ඇති අතර සමාලෝචිත වර්ෂයේදී (2018) දැනට හිඟ හිටි ප්‍රමාණය රු.8,297,399 ක් දක්වා අඩු වී තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීමපිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අපේක්ෂා කළ ප්‍රතිඵල ළඟා කරගැනීමට අපොහොසත් වීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පළාත් නිශ්චිත සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.1,115,226 ක වියදමින් 2016 දෙසැම්බර් 07 දින ඉදිකළ ගෑස් වායු ගොඩනැගිල්ලේ මේ දක්වා ගෑස් නිෂ්පාදන කටයුතු සිදුකර භාවිතයට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගෑස් වායු සැකසීමේ කටයුතු කර භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | Isuru Bio Construction ආයතනයේ විශේෂඥවරයා වන K.M.C.W.B වික්‍රමතිලක මහතා විසින් පසුගිය 2018.10.13 දින අප සභාවට අයත් සාතකාගාරය පරීක්ෂා කොට ඉන් ජීව වායු නිෂ්පාදනය කරන බව සහතික කර ලිපි මඟින් ලබා දී තිබුණි. එය භාවිතා කිරීමට ඉක්මනින් කටයුතු සිදු කෙරේ. |
| (ii) | සාම්පූර් ප්‍රදේශයේ පුරනැඟුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.4,094,702 ක වියදමින් 2017 වර්ෂයේදී ඉදිකළ මාතෘ ළදරු රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර ප්‍රජා මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. | අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාවට අයත් ගොඩනැගිලි හා භාණ්ඩ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ආරක්ෂක නිලධාරීන්ගේ සේවක හිඟයක් පැවතීම සැලකිල්ලට ගෙන සාම්පූර් මාතෘ ළදරු රැකබලා |

| | | |
|---|---|---|
| | | ගැනීමේ මධ්‍යස්ථානය නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම සඳහාත් අධීක්ෂණය කිරීම සඳහාත් මාතෘ ළදරු රැකබලා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක වීමේදී මූදූර් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ උපදෙස් අනුව මහජනතාවට අවශ්‍ය පහසුකම්, පෙර සුදානම්වීම් සිදුකර ලබාදීමටත්, සාම්පූර් විනායගර් ප්‍රජා මධ්‍යස්ථානයට තාවකාලිකව ලබා දී ඇත. මෙම මධ්‍යස්ථානයට මෑතකදී ආසන්න වශයෙන් මීටර් 500 ක් දුරින් දිගුකාලීනව මාතෘ ළදරු රැකබලාගැනීමේ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මකව පවතින අතර, අපගේ මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා සේවක හිඟයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පවතින බැවින් මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කළ නොහැකිව තිබේ. ඉක්මනින් මූදූර් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හරහා අදාළ අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව | සභාව මෙම කාරණාව සම්බන්ධයෙන් සම්පූර්ණ පැහැදිලි කිරීම් ලබාගෙන තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ මෙහෙයුම් ආරම්භ කිරීමට | තිරසාර සංවර්ධනය පිළිබඳ එහි අරමුණු සහ ඉලක්ක පිළිබඳ දැනුවත් වීමෙන් පසුව කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | ------------------ | ------------------------- |
| (අ) | එක් අක්‍රීය බැංකු ජංගම ගිණුමක රු.55,351 ක් ශේෂය වර්ෂ 11 ක සිට පැවතුණද එම ගිණුම ආදායම් ඉපැයිය හැකි ආකාරයකට මාරු කිරීමට විගණන දිනය වන 2019 මාර්තු 21 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් ඉපැයිය හැකි ආකාරයකට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2004 වර්ෂයේදී විශේෂ කොමසාරිස්වරයාගේ කාලපරිච්ඡේදයේ ත්‍රිකුණාමලය ලංකා බැංකු ප්‍රධාන ශාඛාවේ ආරම්භ කළ ජංගම ගිණුමකි. මූදූර් ශාඛාවේ ගිණුම් විවෘත කළ පසුව මෙම ජංගම ගිණුම භාවිතා කර නොතිබුණි. මෙම ගිණුමේ පැවති රු.55,351.69 ක ශේෂය දැනට ජංගම ගිණුමට මාරු කිරීමට 2018.08.16 දිනැති අංක 150 දරන තීරණයට අනුකූලව අංක MUPS/Acct/FD-01/BA/2018 දරන 2018.09.25 දිනැති ලිපිය මඟින් කළමනාකරු, ලංකා බැංකුව, ත්‍රිකුණාමලය යන ලිපිනයට මෙම කරුණ පිළිබඳව කටයුතු කෙරේ. තවද, උපදෙස් ලබා දී උපකාර කිරීමටද ඉල්ලීම් කර ඇත. මේ සඳහා අඛණ්ඩව ක්‍රියා කරනු ලැබේ. |
| (ආ) | යුනිසෙෆ් ආයතනය මූල්‍ය ප්‍රධාන යටතේ සාම්පූර් ප්‍රදේශයේ යළි පදිංචි වූ ප්‍රතිලාභීන් තිදෙනෙකුට ජල සම්බන්ධතාව පහසුකම් ලබාදීමට රු.11,344 ක් 2016 දෙසැම්බර් 25 දින ගෙවා තිබුණු නමුත් මේ දක්වා ජල සම්බන්ධතාවයන් ලබාදී නොතිබුණි. | ගෙවා තිබූ මුදල් ආපසු අයකිරීමට කටයුතු කළ යුතුය. එසේම ජල සම්බන්ධතාවය ලබාදීමට කටයුතු කළ යුතු වේ. | පසුගිය 2018 වර්ෂයේ වහාම සිදුකළ ක්රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2018.07.23 දින ප්‍රතිලාභීන් 12 දෙනෙකුට ජල සම්බන්ධතාවය ලබාදී තිබුණි. ඉතිරි ප්‍රතිලාභීන් තිදෙනා සඳහා ජල සම්බන්ධතාවය ලබාදී නොතිබුණි. පසුගිය වර්ෂයේදී ඔවුන්ට ජල සම්බන්ධතාවය |

| | | | |
|---|---|---|---|
| | | | ලබාදීමට කටයුතු කර තිබුණත් මාර්ගය පළල් කිරීම, මාර්ගයේ වූ ගල් වලින් නෙලන ලද පුවරු, වටේට වූ තාප්ප බෙදා ජල නල එලීම සඳහා ඉඩ හැරීම වැනි ඇති වූ අසීරුතා හේතුවෙන් ජල සම්බන්ධතාවය ලබාදී නොතිබුණි. දැනටමත් මෙම ප්‍රශ්නය පැවැතීම නිසා ජල සම්බන්ධතාව ලබාදීම සඳහා කරනු ලැබූ ගෙවීම් ආපසු ලබාගැනීමට කටයුතු කරමින් පවතී. එසේම ජල සම්බන්ධතාවය ලබාදීමේදී මෙම ගෙවීම් ආපසු ලබාදීම සඳහා කටයුතු කෙරේ. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට අර්ධ වර්ෂය සඳහා තීරණය කළ කුකුළු මස් විකුණුම් මිල රු.400 ක් වුවත්, සභා බල ප්‍රදේශයේ පවතින කුකුළු මස් කඩවල එක කිලෝග්‍රෑමයක් රු.570 කට විකුණනු ලැබේ. මේ පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තීරණය කළ මිලට කුකුළු මස් ලබාදීමට කටයුතු කළ යුතු අතර, එලෙස නොකරන කඩ හිමියන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කුකුළු මස් විකුණුම් මිල සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **xxiv** පරිශිෂ්ඨයේ 1.6 සහ 4 වගන්ති ප්‍රකාරව සේවකයින් තිදෙනෙකුට ලබාදුන් රු.129,620 ක් වූ ණය වර්ෂ 03 සිට 09 දක්වා කාලයක සිට අයකර නොගෙන හිඟ හිටිව පැවතුණි. | කරුණු විමසීම කොට හිඟ ණය ශේෂ අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මුසව්ෆික් මහතා රු.3,000.00, යූ.ආර්.බිස්රුල් හාෆි මහතා රු.24,000.00, යූ.ආර්.සනූස් මහතා 102,620 වශයෙන් නිලධාරීන්ට ලබාදී තිබූ හිඟ ණයවලින් යූ.ආර්.බිස්රුල් හාෆි මහතාගේ රු.24,000 ක් වූ ණය 2019.04.25 දින මුළුමනින්ම ගෙවා ඇත. මුසව්ෆික් මහතාගේ රු.3,000.00 ක ණය අයකිරීම සඳහා ලිපි මුද්‍රර් කලාප අධ්‍යක්ෂවරයාට යවා තිබූ අතර මේ දක්වා එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. කඩිනමින් මෙම මුදල් අයකරනු ලැබේ. රු.102,620 ක් ණය වශයෙන් ලබාගත්, කළමනාකරණ සහකාර යූ.ආර්.සනූස් මහතා ඔහු විසින් සේවය හැර ගොස් තිබූ අවස්ථාවේ මිය ගොස් ඇත. ඔහු ණය ලබාගැනීමේදී වර්ෂ 10 කට අධික සේවා කාලයකින් යුතු වූ නිසා ඇපකරුවන් නොමැති වීමත් ඔහුට පසුව හිමිකරුවන් කිසිවකුත් |

| | | |
|---|---|---|
| | | නොමැති බැවිනුත්, ඔහුගේ ණය අයකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා කටයුතු කරනු ලැබේ. එසේම, ගනු ලබන ක්‍රියාමාර්ග ඔබ වෙත ඒ ඒ අවස්ථාවේදී දැනුම් දෙනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවේ සිටින කාර්යාල කාර්ය සහකාරවරුන් 07 දෙනෙකුගෙන් අභ්‍යන්තර මාරුකිරීම් සේවකයන් තිදෙනෙකුට පමණක් අඛණ්ඩව ලබාදෙමින් තිබුණි. මෙම ස්ථාන මාරු කිරීම් සිදු කිරීමේදී අනෙකුත් සේවකයන් 04 දෙනා සැලකිල්ලට ගනු ලැබ නොතිබූ බව නිරීක්ෂණය විය. | ස්ථාන මාරු කිරීම් සිදුකිරීමේදී වගකිව යුතු අයුරින් සියළු දෙනාටම ලබාදීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍යතාවය අනුවත් සේවකයන්ගේ සේවා කටයුතු පිළිබඳව සැලකිල්ල යොමු කරමින් කලින් ස්ථාන මාරුවීම්ද තාවකාලික බඳවා ගැනීම්ද ලබාදී තිබුණි. මෙම කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කොට කටයුතු සිදුකෙරේ. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 අයිතිය පවරා නොතිබූ වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අනෙකුත් ආයතන වලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මෝටර් රථ 12 ක් වර්ෂ 13 කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කරමින් තිබූ නමුත් ඒවා සභාවේ නමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට පැවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන නැගෙනහිර පළාතේ ප්‍රධාන ලේකම් සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැනි ආයතනවලින් පරිත්‍යාග ලැබූ ඒවාය. මෙයින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් පරිත්‍යාග කළ වාහන සඳහා අයිතිය මාරු කිරීමට ආකෘති පත්‍ර අත්සන් කර සභාවට පවරා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. මාගේ අංක MUPS/WP/RMP/2017 දරන 2017.10.25 දිනැති ලිපිය මගින් වාහන අයිතිකරුවන්ගේ විස්තර ලබාගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට |

ලිපි යවා ඇත. මේ දක්වා ඒ සඳහා ලිපිලේඛන ලබාගැනීමේ අපහසුතා ඇත. මේ බව දැනුම් දෙමි. මෙම අයිතිය මාරු කිරීම් පිළිබඳව කාර්යයන් ඉක්මන් කරනු ලබන අතර ඒ ඒ අවස්ථාවේදී ගනු ලබන ක්‍රියාමාර්ග ඔබට දැනුම් දෙමි.

3.4.2 වත්කම්වලින් ලබාගත යුතු අදායම් ලබාගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෝප්පූර්වල පිහිටි සභාවට අයත් ගොඩනැගිල්ලේ ඇති කාමරයක් 2006 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයේ උප-කාර්යාලයක් ක්‍රියාත්මක කිරීමට ලබාදී තිබූ නමුත්, මේ දක්වා කිසිදු ගිවිසුමක් අත්සන් කර කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් කිසිදු ලිපි ගොනුවක් සභාවේ නොමැත. එසේම ගිවිසුම් අත්සන් කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතු වේ. | කෝප්පූර්වල විදුලි බල මණ්ඩලයට ලබාදී ඇති ගොඩනැගිල්ල පිළිබඳව අදාල ලිපිගොනුව පරීක්ෂා කර වහාම කටයුතු කරනු ලැබේ. එසේම ඒ පිළිබඳ ඒ ඒ අවස්ථාවේදී ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. |

3.4.3 නිෂ්කාර්යව පවතින වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ට්‍රැක්ටර් 02 ක් සහ **pickup** වාහන අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පැවතුණද, වර්ෂ දෙකකට අධික කාලයක සිට අලුත් වැඩියා කිරීමට හෝ ඒවා වෙන්දේසියේ විකිණීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවැතුණි. | අලුත් වැඩියා කර භාවිතයට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, අලුත්වැඩියා කළ නොහැකි වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | **pickup** වාහනයට පසුගිය කාලවල අධික වියදම් ඇති විය. එසේම, මෙම වාහනය ඉතාමත් පැරණිය. ඉදිරියේදී මෙහි නඩත්තු වියදම් වැඩි විය හැකි බැවින් නැගෙනහිර පළාත් ඉන්ජිනේරුවරයා මාර්ගයෙන් ලැබූ අලුත්වැඩියා ඇස්තමේන්තුව සඳහා පසුගිය 2018.02.01 දිනැති අංක **MUPS/FD/QUO/2018** දරන මිල ගණන් නැවත තක්සේරු කිරීමේදී රු.මිලියන 01 කට අධික වියදම් ඇතිවිය හැකි බැවින් අලුත්වැඩියා නොකර වාහනය ලබාදුන් ආයතනයට ආපසු භාරදීමට |

කටයුතු කරනු ලැබේ. එසේම, ට්‍රැක්ටර් 02 කඩිනමින් අලුත්වැඩියා කර ඒවා භාවිතයට කටයුතු කෙරේ.

3.5 ප්‍රසම්පාදනය
---------------

කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සභාවේ අරමුදල් භාවිතා කර වල්ලික්කේනි ප්‍රධාන මාර්ගය ඉදිකිරීම සඳහා රු.1,926,960 කට වලර්මදි ප්‍රජා මධ්‍යස්ථානයට 2017 ඔක්තෝබර් 30 දින පිරිනමා තිබුණි. මෙම කාර්යය ගිවිසුමේ ප්‍රකාරව 2017 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්කරු විසින් අවසන් කර සභාවට භාරදිය යුතු වුවත් විගණිත දිනය වන 2018 ජුනි 20 දින වන විටත් රු.354,207 ක් වටින් "මකී" (Mucky) පමණක් සිදුකර තිබුණි. තවද, සභාව විසින් නිවැරදි සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරු ආරම්භයේදීම තෝරාගෙන කොන්ත්‍රාත් පිරිනැම්මට කටයුතු නොකර ප්‍රජා සංවිධානයකට භාරදී තිබූ බැවින් මෙම කොන්ත්‍රාත්තුව අතරමග නවතා දැමීමට සිදුවිය.<br>මෙම කරුණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ වාර්තාවේ සඳහන් කර තිබූ නමුත් සභාව විසින් මේ දක්වා කිසිදු ආකාරයක ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආරම්භ කළ කර්මාන්තය මහජනතාවට ප්‍රයෝජනවත් ආකාරයට නිම කල යුතු වේ. | ප්‍රජා මූල මධ්‍යස්ථානය ශක්තිමත් කිරීමේ අරමුණෙන් රු.මිලියන 02 ක් ඇතුළත් සංවර්ධන කාර්යයන් සිදුකෙරෙන ප්‍රදේශයේ පවතින ප්‍රජා සංවිධානයට ලබාදේ.<br>ඒ අනුව, වල්ලික්කේනි ප්‍රදේශයේ පවතින වලර්මදි සංවිධානයට අදාල කාර්යය ලබාදී තිබුණි. කොන්ත්‍රාත් කාලයේදී පැවැති අධික වර්ෂාව නිසා "මකී" (Mucky) සහ බොරළු ලබාගැනීමට නොහැකි වීමෙන් මෙම කාලපරිච්ඡේදයේදී වැලි, බොරළු ලබාගැනීමේ බලපත්‍ර ලබාගැනීමේ ප්‍රමාදය නිසාත් මෙම කාර්යයට අවශ්‍ය වැලි, බොරළු ලබාගැනීමේ විශාල අවහිරතාවයන් පැවතුණි. මෙවා නිසා එම කාර්යයන් දෙසැම්බර් 31 දිනෙන් අවසන් කර ඇත. මෙය අඛණ්ඩ කාර්යයක් ලෙස සිදුකිරීමට පසුගිය 2019.01.17 දින අංක 21 දරන තීරණය ලබාගෙන තිබුණි. එම අඛණ්ඩ ක්‍රියාවලිය මගින් එම මාර්ගයේ ඉතිරි වැඩ කඩිනමින් සිදුකරනු ලැබේ. |